දුරකථන ඉලක්කම්/Telephone Nos.
2784832
2784807
2785617

ලේකම්
செயலாளர்
Secretary
2784812

කාර්යාලය
அலுவலகம்
Office
2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.


මගේ අංකය
எனது இல.
My No. } ඊඩී/01/10/01/01/16

ඔබේ අංකය
உமது இல.
Your No. } ..........................................

දිනය
திகதி
Date } 2004-12-02.

**චක්‍රලේඛ අංක 2004/36**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
..........................................

## <u>රජයේ අනුමත ආධාර ලබන හා නොලබන පෞද්ගලික පාසල්වල</u>
## <u>ගුරු ආයතන කටයුතු</u>

රජය අනුමත ආධාර ලබන හා නොලබන පෞද්ගලික පාසල්වල ගුරු ආයතන කටයුතු පිළිබඳව පහත දැක්වෙන කරුණු කෙරේ ඔබේ කාරුණික අවධානය යොමුකරවනු කැමැත්තෙමි.

1. රජය අනුමත ආධාර ලබන පෞද්ගලික පාසල් :-

(i). මෙම පාසල් සඳහා වාර්ෂික ආධාර මුදලක් රජය මගින් ලබා දෙන අතර එම පාසල්වල සේවය කරන අනුමත ගුරුභවතුන් සඳහා වැටුප් ගෙවනු ලබන්නේ මෙම ආධාර මුදලිනි.

මේ අන්දමට වැටුප් ලබන ගුරුභවතෙකු පහත සඳහන් හේතුවක් හෝ වෙනත් හේතුවක් මත සේවයෙන් ඉවත්විය හැකිය.

(අ). ඉල්ලා අස්වීම
(ආ). විශ්‍රාම ගැනීම
(ඇ). සේවය හැර යාම
(ඈ). සේවයෙන් ඉවත් කිරීම
(ඉ). මියයාම

මෙසේ ඉවත්වන ගුරුභවතෙකුගේ වැටුප් වෙනුවෙන්, එම වර්ෂය සඳහා වැටුප් ප්‍රතිපාදන අනුමතව පවතී. එසේ සේවයෙන් ඉවත්වන දිනය වන විට එම ගුරුභවතා වෙනුවෙන් ඉදිරි වර්ෂයේ වැටුප් සඳහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන මුදල් අනුමත කරගෙන නොමැති නම්, නව ගුරුවරයෙකු/ගුරුවරියක පත් කරන තෙක් ඉදිරි වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් අනුමත කර ගැනීම අපහසුවේ. එසේ වනුයේ ඊළඟ වර්ෂය සඳහා මුදල් අනුමත කර ගත හැක්කේ සක්‍රියව සේවය කරනු ලබන ගුරුභවතුන් සඳහා පමණක් වීම නිසාය.

නමුත් යම් ගුරුභවතෙකු සේවයෙන් ඉවත් වීමේ දී ඉදිරි වර්ෂයේ වැටුප් ගෙවීම සඳහා මුදල් අනුමත කර ගෙන ඇත්නම්, ඒ ගුරුභවතා වෙනුවට නව පත්වීමක් ලබන ගුරුවරයාට/ගුරුවරියට වැටුප් සඳහා අනුමතව ඇති මුදල් වලින් ගැටලුවකින් තොරව වැටුප් ගෙවිය හැකිය.

යම් ගුරුභවතෙකු සේවයෙන් ඉවත් වීමේ දී ඉදිරි වර්ෂය වෙනුවෙන් ගුරුවැටුප් සඳහා නියමිත මුදල් ප්‍රමාණය අනුමත කර ගෙන නැත්නම් නව පත්වීම් ලබන්නාට ඉදිරි වර්ෂය සඳහා වැටුප් ගෙවීම ගැටලු සහගත වේ.

මෙම තත්ත්වය වලක්වා ගැනීමට කල යුත්තේ රජයේ අරමුදලින් වැටුප් ලබන ගුරුභවතෙකු සේවයෙන් ඉවත් වන විටම නව ගුරුභවතෙකුගේ යෝජනා පත්‍රය අදාල නිර්දේශ සහිතව ප්‍රමාදයකින් තොරව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබීමට සැලැස්වීමය.

මේ අනුව සේවයෙන් ඉවත් වූ ගුරුභවතාට වැටුප් ගෙවීමට අනුමතව තිබූ මුදල් වලින් නව පත්වීම් ලැබූ ගුරුභවතාට වැටුප් ගෙවීමට කටයුතු සැලැස්විය යුතුය.

(ii). යම් පාසලක ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය හේතු කොට ගෙන පාසලේ යෝග්‍ය ගුරු සංඛ්‍යාව වැඩිවන විට හටගන්නා නව ගුරු තනතුරු පිරවීම සඳහා එවනු ලබන යෝජනාපත්‍ර කලාප හා පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ සහිතව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවිය යුතුය.මේ අන්දමට යෝජනා කොට එවනු ලබන ගුරුවරුන් සඳහා වැටුප් ගෙවීමට ප්‍රතිපාදන දැනට අධ්‍යාපන අමාත්‍යාංශයේ නොමැති නිසා, ප්‍රතිපාදන ලැබුන පසු වැටුප් ගෙවීමේ පදනම මත එම යෝජනාපත්‍ර අනුමත කර එවනු ලැබේ. මෙසේ අනුමත කර එවනු ලබන ගුරුවරුන්ට වැටුප් ගෙවීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලා එවීමට කරුණාකර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දෙන්න.

2. රජය අනුමත, ආධාර නොලබන පෞද්ගලික පාසල් :-

මෙම පාසල් සඳහා රජයේ අරමුදල් සාමාන්‍යයෙන් වෙන් කරනු නොලැබේ. ආධාර නොලබන පෞද්ගලික පාසල්වල, යෝග්‍ය ගුරු සංඛ්‍යාවට සමාන ගුරු සංඛ්‍යාවකට පත්වීම් අනුමත කිරීම පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කෙරේ. ඒ නිසා යම් පාසැලකට ප්‍රමාණවත් පරිදි මෙතෙක් ගුරු පත්වීම අනුමත කරගෙන නැතිනම් අදාල පත්වීම් යෝජනා පත්‍ර සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශය වෙත එවීම කල යුතුය.

3. ඉහත 1 හා 2හි සඳහන් වන පරිදි රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට හිමි ගුරු පත්වීම පාසල් කටයුතු සහ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත කල පසු එම ගුරුභවතුන්ට ගුරුවිශ්‍රාම වැටුප් ක්‍රමයට දායක

විය හැකිය. එම දායක වීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ හිමිකම එම ගුරුභවතුන්ට ලැබේ. නමුත් පත්වීම ක්‍රියාත්මක වන දිනය හා විශ්‍රාම වැටුප් දායකත්වය ඉල්ලා සිටින දිනය අතර පරතරය මාස 12කට වඩා වැඩි වුවහොත් ගුරු විශ්‍රාම වැටුප් අංකය ලබා ගැනීම ගැටලු සහගත විය හැකිය.

4.භාවිතා කල යුතු ආකෘතිපත්‍ර :-

ඉහතින් සඳහන් කල පත්වීම් අනුමත කිරීම සඳහා අවශ්‍ය වන, ගුරු සංඛ්‍යා ගණනය කර ගැනීමට භාවිතා කල යුතු ආකෘතිපත්‍ර මේ සමග එවා ඇත.එම ආකෘතිපත්‍ර පමණක් මෙම කටයුතු සඳහා භාවිතා කරන සේ පාසල් කළමණාකරුවන්ට හා අදාල නිලධාරීන්ට කරුණාකර උපදෙස් දෙන්න.

**(i) ED/01/10/01/01/16(01) ආකෘති පත්‍රය**

රජය අනුමත, ආධාර ලබන හා නොලබන පෞද්ගලික පාසල්වල ගුරු සංඛ්‍යා ගණනය කිරීම සඳහා භාවිතා කිරීමට මෙම ආකෘතිය සකස් කර ඇත.අධ්‍යාපන ලේකම්ගේ 97/4 චක්‍රලේඛ ප්‍රකාරව, තම පාසලේ යම් වර්ෂයක ජූනි 01 දිනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගෙන ඊලග වර්ෂයට හිමි ගුරු සංඛ්‍යාව ගණනය කර ඒ අනුව මෙම ආකෘති පත්‍රය පිටපත් 4කින් සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව අගෝස්තු 31 දිනට පෙර පාසල් කටයුතු පෞද්ගලික පාසල් අධ්‍යක්ෂ වෙත එවීමට අවශ්‍යවේ.

නැවත දන්වනතුරු පෞද්ගලික පාසල්වල ගුරු සංඛ්‍යාව ගණනය කිරීම ඉහත සඳහන් කල 97/4 චක්‍රලේඛය අනුව සිදු කල යුතුය.

**(ii). ED/01/10/01/01/16(02) ආකෘති පත්‍රය**

රජය අනුමත, රජයේ ආධාර ලබන හා නොලබන පෞද්ගලික පාසල්වල ගුරුභවතුන්ගේ පත්වීම් යෝජනා කර එවීම සඳහා භාවිතා කළ යුතු වන්නේ මේ ආකෘති පත්‍රයයි. මෙම ආකෘතිය පිටපත් 4කින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුයි.

**(iii). ED/01/10/01/01/16(03) ආකෘති පත්‍රය**

රජය අනුමත, ආධාර නොලබන පෞද්ගලික පාසල් ගුරුවරුන්ගේ පත්වීම් යෝජනාපත්‍ර අනුමත කළ බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ගුරුවරුන් වෙත දන්වා යැවීමට මෙම ආකෘති පත්‍රය යොදාගත යුතුය.

**(iv). ED/01/10/01/01/16(04) ආකෘති පත්‍රය**

රජය අනුමත, ආධාර ලබන පෞද්ගලික පාසල්වල, වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබෙන ගුරුවරුන්ගේ පත්වීම් යෝජනා පත්‍ර අනුමත කළ බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ගුරුවරුන් වෙත දන්වා යැවීමට මෙම ආකෘති පත්‍රය යොදා ගත යුතුය.

**(v). ED/01/10/01/01/16(05) ආකෘති පත්‍රය**

රජය අනුමත, ආධාර ලබන පෞද්ගලික පාසල්වල වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන්වී නොමැති ගුරුවරුන් සඳහා නව ගුරුපත්වීම් යෝජනා පත්‍ර අනුමත කළ බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ගුරුවරුන් වෙත දන්වා යැවීමට මෙම ආකෘති පත්‍රය යොදා ගත යුතුය.

**(vi).** 1994-10 -06 දින සිට ගුරුවරුන්ට හිමි වැටුප් පරිමාන ඇමුණුමේ 01හි දක්වා ඇත.

**(vii). ED/01/10/01/01/16(06) ආකෘති පත්‍රය**

රජය අනුමත පෞද්ගලික පාසලක ගුරුභවතෙකු සේවයෙන් අස්වීම සඳහා ඉදිරිපත් කරන යෝජනාපත්‍ර නිර්දේශ කර එවිය යුත්තේ මෙම ආකෘතිය මගිනි. මෙම ආකෘතිය පිටපත් 4කින් යුක්තව සම්පූර්ණ කර, ඉල්ලා අස්වීම මසකටවත් පෙර එවිය යුතුය. යම් ගුරුභවතෙකු විශ්‍රාම යෑම සඳහා සේවය අවසන් කරන්නේ නම් විශ්‍රාම යෑමට නියමිත දිනට මාස 6කටවත් පෙර මෙම ආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

**(viii). ED/01/10/01/01/16(07) ආකෘති පත්‍රය**

රජය අනුමත පෞද්ගලික පාසලක සේවයේ යෙදී සිටින ගුරුභවතුන්ගේ නිවාඩු අනුමත කර ගැනීම සඳහා මෙම ආකෘති පත්‍රය යොදා ගත යුතුය. මෙම ආකෘතිය පිටපත් 4කින් සම්පූර්ණ කර හැකි සෑම විටකම නිවාඩු ඉල්ලන දිනට මාස 3කටවත් පෙර ඉදිරිපත් කළ යුතුය. අධ්‍යයන නිවාඩු ඉල්ලුම් කිරීමේ දී, එම අධ්‍යයන නිවාඩු ලබා ගැනීමේ අවශ්‍යතාවය සනාථ කිරීමට අදාළ ලියකියවිලිවල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය. විදේශ නිවාඩු සඳහා ED/01/10/01/01/16(07) විදේශ ආකෘති පත්‍රය පිටපත් 4කින් සම්පූර්ණ කර හැකි සෑම විටම නිවාඩු ඉල්ලන දිනට මාස 03කටවත් පෙර ඉදිරිපත් කළයුතුය.

**(ix). ED/01/10/01/01/16(08) ආකෘති පත්‍රය**

රජය අනුමත පෞද්ගලික පාසලක වයස අවුරුදු 55න් ඔබ්බට සේවය දීර්ඝ කර ගැනීමට බලාපොරොත්තු වන ගුරුභවතුන් මෙම ආකෘති මගින් ඉල්ලුම් කළ යුතුය. මෙම ආකෘතිය පිටපත් 4කින් සම්පූර්ණ කර, විශ්‍රාම යාමට නියමිත දිනට මාස 03කට පෙර එවිය යුතුය.

**(x).ED/01/10/01/01/16(09) ආකෘති පත්‍රය**

රජය අනුමත පෞද්ගලික පාසලක පත්වීම් අනුමත කරනු ලැබ ඇති ගුරුභවතුන්ගේ පෞද්ගලික ලිපිගොනුවට ලබා ගත යුතු ලිපි ලේඛන හා සහතික ලේඛනයක් ඇතුලත් පිරික්සුම් ලැයිස්තුවක් මෙම ආකෘතියේ දැක්වේ. ඒ අනුව අදාල ලිපි ලේඛන ලබා ගෙන ඔවුන් වෙනුවෙන් පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගෙන යාම අපේක්ෂා කෙරේ.

**(xi). ED/01/10/01/01/16(10) ආකෘති පත්‍රය**

රජය අනුමත පෞද්ගලික පාසලක ගුරුභවතුන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල අවශ්‍යයෙන්ම ඇතුලත් විය යුතු ලිපි ලේඛන නාමාවලියක ආකෘතියක් මෙහි දැක්වේ. මේ ආකෘතිය සෑම ගුරුවරයෙකුගේම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර පිටු අංක සඳහන් කර ඒවා නඩත්තු කිරීම යෝග්‍ය වේ.

රජය අනුමත ආධාර ලබන හා නොලබන පාසල්වල ගුරුවරුන්ගේ ආයතන කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම අරමුණු කරගෙන යෝජනා කර ඇති මෙම උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ කාරුණික සහයෝගය උදක්ම බලාපොරොත්තුවේ.

වෛද්‍ය ටාරා ද මෙල්
(අධ්‍යාපන ලේකම්)

පිටපත්

1. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, ..................................
2. රජය අනුමත පෞද්ගලික පාසල් කළමණාකරුවන්